## කල්පිටිය ප්‍රාදේශීය සභාව

### තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම

වයඹ පළාතේ කල්පිටිය ප්‍රාදේශීය සභාවේ පහත දැක්වෙන තනතුරු සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු වී ඇති තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019.04.05 වැනි දින හෝ එදිනට පෙර ''ලේකම්, ප්‍රාදේශීය සභාව, කල්පිටිය'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි අයදුම්කරුවන්ට සහ මෙම සභාවේ දැනට අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු අය කෙරෙහි විශේෂයෙන් සලකා බලනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | විදුලි කාර්මික III වන ශ්‍රේණිය | 01 | PL2-03/2016 | 1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් (06) ක් සමත් වී තිබීම.<br>2. අදළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන් හි (NVQ) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවයක් ලබා තිබීම.<br>3. අදළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමකි. |
| 02 | සෞඛ්‍ය කම්කරු III වන ශ්‍රේණිය | 03 | PL1-03/2016 | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම. |



ඉහත සඳහන් කරන ලද තනතුර සඳහා අදල සුදුසුකම්වලට අමතරව පහත දැක්වෙන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

1. *පොදු සුදුසුකම් :*

(i) අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වර්ෂ 03ක කාලයක් වයඹ පළාතේ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.

(කල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.) ඡන්ද හිමි නාමලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් සහතික කරනු ලබන ග්‍රාම නිලධාරි සහතිකයකින් සනාථ විය යුතුය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2019.04.05 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

(iii) අයදුම්කරු යහපත්/විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

(v) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(vi) ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසන් දිනට පූර්වාසන්න අවුරුදු 05ක කාලය තුළ වරදකට (අවවාද කිරීමකට හැර) දඬුවමක් ලබා නොමැත්තා වූද, සතුටුදායක සේවා කාලයක් සපුරනු ලැබූ අයෙකු විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවයකින් තනතුරු සඳහා අයදුම් කිරීමේදී රාජ්‍ය සේවයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයෙන් හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතුය.

2. *සේවය නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ii) බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන්නේය. ශ්‍රේණිගත උසස් වීමක් නම් අවුරුදු 01ක වැඩ පරීක්ෂක කාල සීමාවකට යටත් විය යුතුය.

(iii) ඉහත තනතුරු යටතේ බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(iv) මෙම සේවයේ සේවකයින් ස්ථාන මාරු කිරීම්වලට යටත් වේ. පළාත් පාලන ආයතනවල ස්ථාන මාරුකිරීමේ බලය ඒ ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන නිලධාරියා සතු වේ. තවද, පළාත් පාලන ආයතනවල ස්ථාන මාරු කිරීමේ බලය ඒ ඒ පළාත් පාලන ආයතන ප්‍රධානියා රජය පිළිගත් නීති රීතිවලට යටත්ව තීරණය කළ හැකිවේ.

(v) මෙම බඳවා ගැනීම් සිදු කරනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටද, ආයතන සංග්‍රහයට හා මුදල් රෙගුලාසිවලටද රජය හෝ පළාත් සභාවේ හෝ දෙපාර්තමේන්තු නියෝගවලටද, වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලටද අනුකූලවය. ඒ අනුව ක්‍රියා කිරීමට පත්වීම්ලාභීන් බැඳී සිටිය යුතුය.

3. *බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) බඳවා ගැනීමේ පටිපාටිය අනුව ලිඛිත/ව්‍යුහගත පරීක්ෂණයක ප්‍රතිඵල මත හෝ අවශ්‍යතාවය අනුව ප්‍රායෝගික පරීක්ෂණයක කුසලතාවය මත සුදුසුකම් ලබන අයව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් සුදුස්සන් තෝරා ගැනේ.

(ii) බඳවා ගැනීමේ පටිපාටීන්ට අනුව ලිඛිත/ව්‍යුහගත පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයක් නොමැති තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ලකුණු හා සුදුසුකම් මත සුදුස්සන් තෝරා ගැනේ.

4. *අයදුම් කිරීමේ ක්‍රමය :*

(i) මෙහි දැක්වෙන ආකෘතියට අනුව ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත්‍රය ශීර්ෂ අංක 01 සිට 13 තෙක් පළමුවන පිටුවටද ඉතිරිය දෙවන පිටුවටද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර ඒ සමග පහත සඳහන් සහතිකපත්‍රවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය. මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

(1) උප්පැන්න සහතිකය;
(2) ජාතික හැඳුනුම්පතේ පිටපත හෝ වලංගු හැඳුනුම්පතක් ;
(3) මූලික අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන ලියවිලි ;
(4) වෘත්තීය හෝ පළපුරුද්ද සනාථ කෙරෙන ලියවිලි ;
(5) තම පදිංචිය සනාථ කිරීම පිණිස මෑතකදී ලබාගත් ග්‍රාම සේවා සහතිකය ;
(6) රියදුරු තනතුර සඳහා අයදුම්කරන්නන් මෝටර් රථ පැදවීමේ බලපත්‍රයෙහි ඡායා පිටපතක්;
(7) වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.



(ii) මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් පමණක් පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

(iii) අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ බඳවා ගැනීමට නියමිත තනතුරු සංඛ්‍යාව සංශෝධනය/තීරණය කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල කල්පිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

(iv) අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්පත් යොමු කරන තනතුර, *ගැසට් නිවේදනයේ* සඳහන් පරිදි පැහැදිලිව සටහන් කළ යුතුය. අසම්පූර්ණ හා 04 ඡේදය යටතේ සඳහන් සහතිකවල පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ආර්. මංගල රාමනායක,
ලේකම්,
කල්පිටිය ප්‍රාදේශීය සභාව.

2019 මාර්තු මස 05 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය සභාව,
කල්පිටිය.

### ආදර්ශ අයදුම්පත්‍රය

*කල්පිටිය ප්‍රාදේශීය සභාව*

*........................................ තනතුරු සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————————
02. මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————
03. ස්ථිර ලිපිනය:——————————
04. ජාතික හැඳුනුම්පත් අංකය:——————————
05. දුරකථන අංකය:——————————
06. උපන් දිනය : වර්ෂය :—————— මාසය :—————— දිනය :——————
07. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට (2019.04.05) වයස : අවු.:—————— මාස:—————— දින:——————
08. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————
09. විවාහක/අවිවාහක බව:——————————
10. ඔබ දැනටමත් කල්පිටිය ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේද? ඔව්/නැත.:——————————
    එසේ නම් දරන තනතුර, සේවා කාලය, එම පත්වීම ස්ථිර ද/තාවකාලිකද/අනියම් ද /කොන්ත්‍රාත් ද යන වග:——————
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? ඔව්/නැත. එසේ නම් පරම්පරාවෙන්ද/ලියාපදිංචි වීමෙන්ද යන වග:——————————
12. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය.):——————————
13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම්:——————————

——————,
දිනය:——————. අයදුම්කරුගේ අත්සන.

*දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන ..........................................................මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ (ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්) පදනම මත.................................................. කු වශයෙන් සේවය කරයි. ඔහු/ඇය අයදුම්කරන තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීමකට හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම:——————————
තනතුර:——————————
නිලමුද්‍රාව:——————————
දිනය:——————————

03-997

Source: Government Gazette (2019.03.22)